නිපුණතාව :- නර්තන කලාව හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

නිපුණතා මට්ටම :- දේශීය නර්තන සම්ප්‍රදායන්ට අයත් නිර්දේශිත ශාන්තිකර්ම පිලිබඳ තොරතුරු විමසුමට ලක් කරයි.

ක්‍රියාකාරකම :- බලි ශාන්තිකර්මය

---

- නිවැරදි පිළිතුරු යටින් ඉරක් අදින්න.

**01.** සිංහලයෝ කෑමට පෙර බත්ගුලියක් වෙන් කිරීම වීරක ජාතකයේ දක්වෙන්නේ කුමන නමින් ද?
(1) බලු කපුටු දානය (2) කාක බත් (3) බලි බත් (4) දේව දානය

**02.** සිංහල බෞද්ධයෝ ග්‍රහ අපල වලින් මිදීමට බත් දෙනු ලබන්නේ,
(1) කපුටන්ට (2) බල්ලන්ට (3) බළලුන්ට (4) දෙවියන්ට

**03.** වජ්ජීන් විසින් බලි පුද දී ඇති යක්ෂයා වන්නේ,
(1) වලවාමුඛී (2) සාරානන්ද (3) කළු යකා (4) මහසෝනා

**04.** අභිධානප් පදීපිකාවේ බලි පුට්ඨා නමින් හඳුන්වන්නේ,
(1) බලි ඇඳුරා (2) ගවයා (3) කපුටා (4) බෙරවාදකයා

**05.** නරවරයාට දෙනු ලබන තෑග්ග ලෙස ''බලි'' යන පදය සඳහන්ව ඇත්තේ,
(1) දීඝ නිකායේ (2) මහා වංශයේ
(3) මජ්ජිම නිකායේ (4) දීප වංශයේ

- හිස්තැනට සුදුසු පිළිතුර යොදන්න.

**06.** පොළොන්නරු යුගයේ දී ............................... රජුට බලියාගයන් පවත්වා ඇත.
**07.** කාක බලි සම්බන්ධ තොරතුරු ලැබෙන්නේ ...............................සාහිත්‍යයේය.
**08.** බමුණු ක්‍රමයට තිබු බලියාගයට බුදුගුණ ඇතුළත් කොට විධිමත් කරන ලද්දේ ............................... හිමි විසිනි.
**09.** බලි ශාන්ති කර්මයට බෞද්ධාගමික ලක්ෂණ එක් වුයේ ............................... යුගයේදී
**10.** බලි ඇදුරාගේ වම් අතෙහි ...............................හා දකුණතෙහි ...............................ඇත.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

**11.** බලි යන වචනය අර්ථ දක්වන්න.
**12.** බලි ශාන්තිකර්මයේ ආරම්භය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්න.
**13.** පැවැත්වීමේ අරමුණු නම් කරන්න.
**14.** බලි ශාන්තිකර්මයේ චාරිත්‍ර නම් කරන්න.